# මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු නාමය :** කළමනාකරණ සහකාර

**තනතුරු සංඛ්‍යාව :** තනතුරු 08

**වැටුප :**

MA 1-2-2016 (රු. 27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - රු. 49,080/-) + රජයේ අනුමත වෙනත් දීමනා ඇතුළත්ව වැටුපෙන් 8%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3%ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

**වයස :** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

**පත්වීමේ ස්වභාවය :** ස්ථිර පදනමින් බඳවාගන්නා අතර වසර 03ක පරිවාස කාලයකට යටත්වේ.

**සුදුසුකම් :**

අධ්‍යාපන

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය,
  - සිංහල / දෙමළ
  - ඉංග්‍රීසි
  - ගණිතය

  යන විෂයන් ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සමත්වීම

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය අවම වශයෙන් විෂයයන් තුනක් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**වෙනත් සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ඉන් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය මත බඳවාගනු ලැබේ.

**බඳවාගැනීමේ කොන්දේසි :**

බාහිර අයදුම්කරුවකු තෝරා පත්වුවහොත් අදාළ තනතුරට ඔහු/ඇය වසර 03ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත බඳවාගනු ලබන අතර රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය ද්විතීයන පදනම මත බඳවා ගනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.12.27 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, පළමු මහල, නව ගොඩනැගිල්ල, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හෝ wbb.commisioner.vacancy@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ හැකිය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනය වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර විද්‍යුත් තැපෑල මඟින් අයදුම්පත් යොමුකිරීමේදී විෂය (Subject) යටතේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**පළමු මහල, නව ගොඩනැගිල්ල**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**කොළඹ 01**